# මීමුරේ ගම්මානයේ වර්තමාන ජන ජීවිතය

බී.ආර්.අයි. විනෝදනී බෝරදෙනිය*, එස්.එන්. කන්කානම්ගේ, එච්.එම්.එම්.එම්. හේරත්

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
imeshavinodani332@gmail.com*

**මුඛ්‍ය පද** - ජන ජීවිතය, මීමුරේ, වර්තමාන, සාම්ප්‍රදායික

## හැඳින්වීම

ගම යන සංකල්පය ග්‍රාමීය සමාජයේ මූලික ඒකකය වේ. ගම සමාජ පරිණාමයේ එක් අවස්ථාවක බිහි වූවක් බව පිළිගනී. නවශිලා යුගයේ කෘෂිකාර්මික ජීවන රටාවකට මිනිසා හුරුවීමත් සමඟ ගොවිතැන් කිරීම ඇරඹි අතර එම නිසා මානවයා ස්ථිර ජනාවාස සකස් කර ගැනීමට යොමු වී ඇත. මෙසේ ගම යන සංකල්පය නවශිලා යුගයේ දී බිහි විය. ගම වූ කලී අතීතයේ මහ සමාජයෙන් වෙන්ව පැවති ඒකකයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ගම සංකල්පය පිළිබඳ විමසා බැලීමේ දී මෙසේ බාහිර සමාජවලින් වියුක්තව පවත්නා ගම්මානයක් ලෙස මීමුරේ ගම්මානය හඳුනා ගත හැක. මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීමුරේ නම් වූ ගම්මානය පිහිටා ඇත. මෙම ගම සාම්ප්‍රදායික ගති සිරිත්වලින් අනූන මනස්කාන්ත ස්වාභාවික පරිසරයකින් සමන්විත වූ ගම්මානයකි. ගමටම ආවේණික වූ දේශපාලන, සංස්කෘතික, සමාජීය, ආර්ථික හා ආගමික අංගවලින් සමන්විත වේ. එසේ වූවද ගමක් ලෙස ආරක්ෂා වී තිබුණ ද අද වන විට ගෝලීයකරණයත් සමඟ සමාජයේ සිදු වන්නා වූ වෙනස්වීම්වලට අනුගත වෙමින් ගම තුළ වූ අංගයන් ද වෙනස්වීම්වලට ලක්ව ඇත. ඒ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් මීමුරේ ගම්මානයේ ජනතාවගේ ජනජීවිතය පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේෂණ මඟින් තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. එහි දී මීමුරේ ගම්මානයට ගොස් ග්‍රාමයේ ග්‍රාමසේවක ඇතුළු ගම්වැසියන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කර තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ලක්ගල ඇතුළු නකල්ස් කඳු ශිඛර පාමුල පිහිටි මීමුරේ ගම්මානය ශ්‍රී ලංකාවේ පිහිටි දුෂ්කර ගම්මානයකි. අතීතයේ සිටම සාම්ප්‍රදායික ජන ජීවිතයක ලක්ෂණ හඳුනාගත හැකි මෙම ගම්මානය වර්තමානයේ විශාල වෙනසකට ලක් නොවුව ද කෙමෙන් නූතන ජන සමාජයකට අනුවර්තනය වන ආකාරයක් හඳුනා ගත හැකි විය. වර්තමානයේ මෙහි පවුල් 121ක් පමණ ජීවත් වේ. ගමෙහි පවුල්වල සාමාජිකයන් විශාල ප්‍රමාණයක් ජීවත් වන විස්තෘත පවුල් දක්නට ලැබේ. වර්තමානයේ ගමෙහි ප්‍රධානියා වන්නේ ග්‍රාම නිලධාරීතුමා වන අතර ගම්වැසියන් ඔහුට ආරච්චි මහතා ලෙස ආමන්ත්‍රණය කරයි. මීමුරේ ජන ජීවිතය පිළිබඳ විමසීමේ දී ගමේ ජනතාවගේ ආහාර රටා, ඇඳුම් පැළඳුම් මෙන්ම නාමයන් ද වර්තමානය වන විට නූතන සමාජයට අනුවර්තනය වී ඇත. එසේම අතීතයේ සාම්ප්‍රදායික වෙදකම්වලට මුල්තැන දුන් මීමුරේ ග්‍රාමයේ මේ වන විට රෝහලක් ඉදිකර ඇති ආකාරය දක්නට ලැබුණි. මීමුරේ ගම්මානයේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. ගම්වැසියන් සියලු දෙනාම එකතු වී අත්තම් ක්‍රමයට ගොවිතැන් කටයුතුවල යෙදීම සිදු වේ. ගොවිතැන් කටයුතු සඳහා බොහෝවිට මීමුරේ ගම්මානයේ තවමත් පැරණි ආකාරයට ගැමියන් විසින් ගවයින් යොදාගෙන කෘෂිකාර්මික කටයුතු සිදු කළ ද වර්තමානය වන විට ඔවුන් කෙමෙන් ට්‍රැක්ටර් ආදී යන්ත්‍ර සූත්‍ර භාවිතයට හුරු වන ආකාරයක් හඳුනාගත හැකි විය. එසේම එළවළු වර්ග, අල වර්ග ගම තුළ වගා කර ඒවා ගමේ කුඩා වෙළඳසැල්වල විකිණීමද සිදු කරයි. ගම්මිරිස් ද සුළු අපනයන බෝග ලෙස ගමේ ආර්ථිකය ශක්තිමත් කරයි. වර්තමානයේ දී මොවුන්

සංචාරක කර්මාන්තය සඳහා යොමු වීමත් සමඟ ආර්ථික මට්ටමේ වර්ධනයක් සිදුව ඇති බව හඳුනාගත හැක. විශේෂයෙන් ම 2004 වසරේ තිරගත වූ සූරිය අරණ චිත්‍රපටයේ දර්ශන තලයක් ලෙස මීමුරේ දීඹිගොල්ල ඔය යොදා ගැනීමෙන් පසු මෙය දේශීය සංචාරකයන් අතර ජනප්‍රිය විය. 2007 වසරේ සිට ගම්මානයේ රාජ්‍ය අනුග්‍රහය ද සහිතව සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක විය. සංචාරක කර්මාන්තය නිසාම මීමුරේ ගම්මානයට වර්තමානයේ දී නව සංස්කෘතියක් බිහි වෙමින් තිබේ. ඒ හරහා ගමේ සංචාරකයන් සඳහා කුඩාරම් නිවාස ආදිය ඉදිවීම දක්නට ලැබේ. එසේම නව තාක්ෂණය ගමට කෙමෙන් මුසු වීම සිදු වේ. අන්තර්ජාල පහසුකම් පවා නොතිබූ මීමුරේ ගම්මානයට දුරකථන හා අන්තර්ජාල පහසුකම්ද ලබා දී ඇත. අතීතයේ යාමට මාර්ගයක් පවා නොතිබූ ගමේ මාර්ග පද්ධතිය ද මේ වන විට හොඳින් සකස් කර ඇත. ප්‍රවාහන කටයුතු සඳහා ඇතැම් නිවෙස්වල ත්‍රීරෝද රථ, මෝටර් බයිසිකල් ආදිය දක්නට ලැබුණි. ගමේ බස් රථය දිනකට වරක් පමණක් ඇති නිසා බස් රථය මීමුරේ වැසියන් නගරයට යාම සිදු කරන්නේ මසකට වරක්ය. ගම මධ්‍යයේ පිහිටි කුඩා වෙළඳසැල් මඟින් ගමේ ජනතාවගේ සියලු අවශ්‍යතා සපුරාලනු ලබයි. මීමුරේ පවුල් සමාජය පිළිබඳ තොරතුරු විමසා බැලීමේ දී අතීතයේ දී මෙන් වර්තමානයේ එක් පවුලක සාමාජිකයන් රාශියක් නොමැති බව හඳුනාගත හැක.

මීමුරේ ගම්මානයේ දරුවන්ට අධ්‍යාපනය සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක්, ප්‍රාථමික විදුහලක් සහ කනිටු විදුහලක් ගම්මානයේ ම ඉදිකර ඇත. එසේ වුවද ඔවුන්ට උසස් අධ්‍යාපනය සඳහා ගමේ පාසලේ පහසුකම් නොමැති නිසා නගරයට යාමට සිදු වේ. මේ නිසාම උසස් අධ්‍යාපන කටයුතු හොඳින් සිදු කරන තරුණ පරපුරේ බොහෝ දෙනෙකු ගම අතහැර යාමක් දක්නට ලැබේ. එසේ නොමැති දරුවන් බොහෝවිට සාමාන්‍ය පෙළින් පසු ඉගෙනීම නවතා තම දෙමව්පියන්ගේ කුඹුරු ගොවිතැන් කටයුතුවලට යොමු වීම දක්නට ලැබේ. ගමේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පුස්තකාලයක් ද ඉදි වී තිබෙන ආකාරය දක්නට ලැබුණි. අතීතයේ කෘෂිකර්මාන්තය මත පමණක් යැපෙමින් සිටි මීමුරේ ජනතාව වර්තමානයේ ගුරු වෘත්තිය, ආරක්ෂක අංශය, ඇඟලුම් ක්ෂේත්‍රය වැනි රජයේ සහ පෞද්ගලික රැකියා සඳහා යොමු වීමක් සිදු වී ඇත. වර්තමානයේ ගම්මානයට ජලය හා විදුලි පහසුකම් ලබා දී ඇත. එහි දී 2015 වන තුරුම හීන් ගඟ හරහා බලාගාරයක් මඟින් විදුලිය ලබා ගත් මීමුරේ ගම්මානයට 2015 වර්ෂයේ රජයේ මැදිහත්වීම මත විදුලිය ලබා දී ඇත. එසේම බෞද්ධාගමික ගම්මානයක් වන මෙහි විහාරස්ථානයේ ද නව ඉදිකිරීම් සිදු කරමින් පවතී. මීමුරේ ගම්මානයේ ජනතාව අතර දේව ඇදහිලි ද බහුලව පවතින බව පැහැදිලි වේ. විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා කන්දෙ බණ්ඩාර,වන්නි බණ්ඩාර වැනි දෙවිවරුන් සඳහා පූජා පැවැත්වීම වර්තමානයේ ද සිදු කරයි. ගෝලීයකරණයේ බලපෑම තුළින් ගම යන සංකල්පය වෙනස් වෙමින් පවතින අතර මෙම වෙනස්වීම් මීමුරේ ගම්මානයේ ද සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික වෙනස්වීම් කෙරෙහි බලපා ඇති මෙම අධ්‍යයනය මඟින් හඳුනාගත හැකි විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

**(සම්මුඛ සාකච්ඡා)**

ඒ.එම්. මුදලි, (අවු. 93) 2023 ජුනි 13.

එම්.කේ.ජී. කුසුමාකුමාරි, (අවු. 53) 2023 ජුනි 13.

සී.අයි.බී. වනිගසේකර, (අවු. 44) 2023 ජුනි 13.

එච්.එම්. මුතුබණ්ඩා, (අවු. 67) 2023 ජුනි 13.